# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,402 - 2024 සැප්තැම්බර් මස 13 වැනි සිකුරාදා - 2024.09.13**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... ... | 354 |
| මුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | 358 |
| විවිධ දැන්වීම් ... ... ... ... | 360 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2024 ඔක්තෝබර් මස 04 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 සැප්තැම්බර් මස 20 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**206 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


353 - B 082608 — 353 (2024/09)
D I -

# පිස්කල් විකිණීම්

**මොරටුව දිසා අධිකරණයේ දී ය**

පිස්කල් මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

මහජන බැංකුව,
අංක 75,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත,
කොළඹ 02.

........................*පැමිණිලිකරු.*

නඩු අංකය : 140/13/MB
ස්වභාවය : උකස් බැඳුම්කර
වටිනාකම : රු. 929,323.60/-

*එදිරිව*

සුමිත් දිසානායක,
අංක 10,
දකුණු මොරටුමුල්ල,
මොරටුව.

...........................*විත්තිකරු.*

වර්ෂ 2019 ජුනි මස 12 වැනි දින මොරටුව දිසා අධිකරණයේ නඩු තීන්දුව අනුව විත්තිකරු විසින් රුපියල් ලක්ෂ 800,000ක මුදලක් පැමිණිලිකරුගෙන් ණයට ගෙන ඇති බැවින්, එම රු. 800,000/- ක මුදල සහ නඩු පැවරූ දින සිට තීන්දු ප්‍රකාශය ක්‍රියාත්මක කරන දිනය දක්වා නෛතික පොළිය ද, නඩු ගාස්තු ඉහත නම් සඳහන් විත්තිකරු විසින් පැමිණිලිකාර බැංකුවට ගෙවිය යුතු බවට ද, නියෝග නිකුත් කොට තීන්දු කර ඇත.

එකී ගෙවීම් කිරීමට විත්තිකරු අපොහොසත් වී හෝ පැහැර හැර ඇති බැවින් එකී අධිකරණයේ මා වෙත ලැබී ඇති අධිකාරී බලපත්‍රයේ බලය පිට මා විසින් දැනටමත් තහනමට ගෙන ඇති ඉහත නම් සඳහන් වන විත්තිකරුට අයත් පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති නිශ්චල දේපළ,

**වර්ෂ 2024ක් වූ ඔක්තෝබර් මස 10 වැනි දින පෙ. ව. 10.00 ට,**

ඉහත නම් සඳහන් විත්තිකරුගේ දේපළ පිහිටි බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ, පල්ලේ පත්තුවේ, මොරටුවේ, මොරටුව මහ නගර සභා සීමාව තුළ මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මොරටුමුල්ල යන ගමේ පිහිටි "කඩුපිටියවත්ත" නැමැති ඉඩම පිහිටි ස්ථානයේ දී, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

***උපලේඛනය***

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ, පල්ලේ පත්තුවේ, මොරටුවේ, මොරටුව මහ නගර සභා සීමාව තුළ මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්, මොරටුමුල්ල යන ගම පිහිටි වරිපනම් අංක 10 දරන "කඩුපිටියවත්ත" කියන ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ඩී. එන්. ප්‍රනාන්දු විසින් මැන සකසන ලද 2009.10.25 දිනැති අංක 6410 දරන පිඹුරේ දක්වෙන කැබලි අංක 1 බී දරන බිම් කැබැල්ලට මායිම් : උතුරට : එම්. ආර්. එම්. සිල්වාට අයත් දේපළ ද, නැගෙනහිරට : ලොට් අංක 1 සී ද, දකුණට : මීටර් 4.5 ක් පළල පාර ද, බස්නාහිරට : ලොට් අංක 1ඒ ද යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් හයයි දශම අටයි තුනක් (පර්. 6.83) බිම සහ ඒ තුළ පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සියලු දේ ද වේ.

මෙම ඉඩම දෙල්කඳ, නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ D 41/32 දරන පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇත.

ඩබ්ලිව්. ඒ. එන්. ගුණතිලක,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය - මොරටුව.

වර්ෂ 2024ක් වූ අගෝස්තු මස 29 වැනි දින දී ය.

09-103

**කොළඹ වාණිජ මහාධිකරණයේ දී ය**

කෝට්ටේ, ඇතුල් කෝට්ටේ කොටුබැම්ම පාරේ පිහිටි නිවසක් සහිත ඉඩමක්

පිස්කල් මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී,
(මීන් පෙර මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා පීඑල්සී)
බෑන්ක් ඔෆ් සිලෝන් මර්චන්ට් ටවර්,
අංක 28, ශාන්ත මයිකල් පාර,
කොළඹ 03.

නඩු අංකය : HCC/610/2016/MR

*..............පැමිණිලිකරු.*

*- එදිරිව -*

1. සී/ස. ඔරු මික්ස් ඇස්ෆල්ට් (පුද්ගලික) සමාගම,
අංක 575, නාවල පාර, රාජගිරිය.

2. ජේ. එස්. ලසන්ත සේනාරත්න,
අංක 658, බේස්ලයින් පාර, කොළඹ 09.

*නව ලිපිනය :*

ජේ. එස්. ලසන්ත සේනාරත්න,
අංක 6, කොටුබැම්ම පාර, ඇතුල්කෝට්ටේ,
කෝට්ටේ.

*...............විත්තිකරුවෝ.*

කොළඹ වාණිජ මහාධිකරණයේ ඉහත අංක දරන නඩුවෙන් මා වෙත නිකුත් කර ඇති දේපළ විකිණීමේ අධිකාරි පත්‍රයට අනුව නඩුවේ ඇතුළත් කර ඇති 2021.11.23 වැනි දිනැති සමථ තීන්දු ප්‍රකාශය අනුව ඉහත විත්තිකරුවන් විසින් පැමිණිලිකාර බැංකුවට ගෙවිය යුතු රු. 65,200,248.61 ක මුදල හා 2016.08.16 වැනි දින සිට සම්පූර්ණ ගෙවීම් සිදු කරන දිනය දක්වා රු. 29,781,338.08ක මුදල මත වාර්ෂිකව 29%ක අනුපාතයට වැඩිදුර පොළියක් ද, ඒ මත වෙනත් නීත්‍යානුකූල ගාස්තු ද, නඩු ගාස්තු ද ගෙවීමට නියෝග කර එකී බැඳුම්කරය මත රු. 30,000,000/- මුදල හා වැඩිදුර පොළිය සහ පිරිවැය සඳහා මෙහි පහත උපලේඛනයේ වඩාත් විස්තර වන කෝට්ටේ, ඇතුල් කෝට්ටේ, කොටුබැම්ම පාර අංක 06 දරන ස්ථානයේ පිහිටි දෙමහල් නිවස සහිත ප්‍රමාණයෙන් පර්චස් දහසයයි දශම හතයි නවයක් (පර්. 16.79) වන දේපළ වෙන්දේසියේ විකුණන ලෙසට මා වෙත නියෝග කර ඇති බැවින් එම දේපළ පිළිබඳ වෙන්දේසිය,

**2024 ක් වූ ඔක්තෝබර් මස 03 වැනි දින පෙ. ව. 11.00 ට,**

දේපළ පිහිටි ස්ථානයේ දී මවිසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

*දේපළට පිවිසෙන මාර්ගය.-*

පිටකෝට්ටේ හංදියේ සිට බංගලා හංදිය පසුකර ඇතුල්කෝට්ටේ දෙසට යන විට දකුණු පැත්තට ඇති කොටුබැම්ම පාරේ මීටර් 200ක් පමණ ගිය පසු ටී. හැඩගේ පාරේ දකුණු පැත්තට මෙම දේපළ පිහිටා තිබේ. වරිපනම් අංක 6 වන අතර දෙමහල් නිවස සහිත ඉඩම වේ.

*වෙන්දේසියේ ගෙවීමේ ක්‍රමය.-*

වෙන්දේසිය අවසන් වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් කොළඹ වාණිජ මහාධිකරණයේ රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල් වන මා වෙත පහත දැක්වෙන පරිදි මුදල් ගෙවිය යුතු ය. සියළුම ගෙවීම් මුදලින් හෝ බැංකු අණකරවලින් පමණක් ගෙවිය යුතු ය. චෙක්පත් බාරගනු නොලැබේ.

01. සම්පූර්ණ විකුණුම් මුදලින් සියයට විසිපහක (25%) මුදලක් එවලේම මා වෙත ගෙවිය යුතු ය. විකුණුම් මුදලේ ඉතිරි සියයට හැත්තෑ පහක (75%) මුදල වෙන්දේසි දින සිට දින තිහක් (30) ඇතුළත කොළඹ වාණිජ මහාධිකරණයේ ඉහත අංක දරන නඩුවේ බැරට තැන්පත් කළ යුතු ය.

02. සිවිල් නඩු විධාන සංග්‍රහයේ 258 වගන්තිය යටතේ වන පිස්කල් ගාස්තු ද එම අවස්ථාවේ දී ම මා වෙත ගෙවිය යුතු ය.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරලේ, පල්ලේ පත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා බල ප්‍රදේශයේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ ඇතුල්කෝට්ටේ පිහිටි, ඇතුල්කෝට්ටේ ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ පිහිටි "කණුවේවත්ත නොහොත් වලව්වත්ත" නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ඩී. ජේ. වී. පෙරේරා විසින් මැන සකස් කළ 1986 සැප්තැම්බර් 15 දිනැති අංක 7750/පී දරන පිඹුරෙහි දක්වා ඇති ලොට් අංක 07 දරන බෙදා වෙන් කළ බිම් කොටසට මායිම් : උතුරට : රැම්පාට් පාර ද, නැගෙනහිරට : රැම්පාට් පාර ද, දකුණට : ලොට් අංක 08 දරන කොටස සහ බස්නාහිරට : ලොට් අංක 06 දරන කොටස ද යන මෙකී මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහසයයි දශම හතයි නවයක් (පර්. 16.79) වන ඉඩම වේ. මෙම ඉඩම දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M 3375/151 පත් ඉරුවෙහි ලියාපදිංචි කර ඇත.

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
කොළඹ වාණිජ මහාධිකරණය,
කොළඹ 12.

වර්ෂ 2024ක් වූ සැප්තැම්බර් මස 06 වැනි දින,
කොළඹ වාණිජ මහාධිකරණයේ දී ය.

09-127

---

**හලාවත දිසා අධිකරණයේ දී ය**

**පිස්කල් මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි**

1990 අංක 02 දරන (සංශෝධිත) ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ සහ එය ප්‍රකාරව නෛසයි තීන්දු ප්‍රකාශයක් සහ නියත තීන්දු ප්‍රකාශයක් ලබාගැනීම සඳහා වන කාරණාවේ දී ය.

අමානා බැංකුව,
අංක 486, ගාලු පාර,
කොළඹ 03.

............*පැමිණිලිකරු.*

නඩු අංකය : DDR /6728/2021
ස්වභාවය : ණය ආපසු අයකර ගැනීම්
කාර්ය පටිපාටිය : සාමාන්‍ය
වටිනාකම : රු. මිලියන 6.5
ඇස්කිසි අංකය : 11/2024

*එදිරිව*

1. සින්නදුරේ කුගපාරන්,
ස්ටාර් ඇසෝසියේට්ස් හි හිමිකරු,
අංක 49/10, සිංහපුර පාර,
හලාවත.

2. කිංග් අක්වා සර්විසස් පුද්ගලික සමාගම,
අංක 53 බී, සිංහපුර පාර,
හලාවත.

..................*විත්තිකරුවන්.*

වර්ෂ 2021ක් වූ අගෝස්තු මස 29 වැනි දින දරන හලාවත දිසා අධිකරණයේ නඩු තීන්දුව අනුව එකී පැමිණිලිකරුට 1 වන විත්තිකරුගෙන් අයකර ගැනීමට නියමිත රු. 6,262,874.14/- ක මුදල සහ ඒ මත 2021 පෙබරවාරි මස 1 වැනි දින සිට, එකී මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමවන තුරු, මාස 6කට ගලපන ලද ශ්‍රී ලංකා අන්තර් බැංකු අර්පණ අනුපාතිකය සහ 6%ක වාර්ෂික අනුපාතිකයක් යටතේ වූ ආයෝජනය/ලාභය සමඟ වූ මුදල සහ නඩු ගාස්තු ද ගෙවිය යුතු බවට නියෝග කොට තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින් ද,

මා විසින් 2024.02.15 වැනි දින තහනම් කරන ලද පහත උපලේඛනයේ සඳහන් කර ඇති දේපළ එම දේපළ පිහිටි ස්ථානයේ දී,

**වර්ෂ 2024ක් වූ ඔක්තෝබර් මස 15 වැනි දින පෙ. ව. 11.00 ට මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.**

### උපලේඛනය

01. වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයට අයත්, උතුරු පිටිගල් කෝරළයේ, ආනවිලුන්දන් පත්තුවේ, ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ආරච්චිකට්ටුව ග්‍රාම සේවා නිලධාරි වසමේ, ආරච්චිකට්ටුව ගම පිහිටි තිඹිරිගහවත්ත නමැති ඉඩමට, එස්. ශ්‍රීධරන් බලයලත් මිනින්දෝරු තැන විසින් මැන සාදන ලද අංක 4113/2009.04.30 දරන පිඹුර ප්‍රකාර බෙදූ 05 දරන ඉඩම් කොටසට මායිම් :

*උතුරට* : එම්. ඩබ්. එල්. ජේ. ජේ. පීරිස් මානක තැනගේ අංක 1007/1997.07.07 පිඹුරේ සඳහන් ලොට් 01 දරන කොටස ද,
*නැගෙනහිරට* : එච්. විජේනාතන්ට අයිති ඉඩම ද,
*දකුණට* : එල්. ඒ. ආර්. පෙරේරාට අයිති ඉඩම ද,
*බස්නාහිරට* : එකී පිඹුරේ සඳහන් ලොට් 06 දරන කොටස ද, ලොට් 09 දරන මීටර් හයයි දශම එකක් වන අඩි පළල ප්‍රවේශ මාර්ගය සහ එකී පිඹුරේ ලොට් 04 දරන කොටස ද,

යන මායිම් තුළ පිහිටි රූඩ් එකයි පර්චස් දහයක් (රූ. 01, පර්. 10) විශාල ඉඩමේ බිම සහ ඊට අයත්, ගසකොළ, පළතුරු, ගොඩනැගිලි ආදි සෑම සියලු දේ ද වේ.

තව ද, එකී ආරච්චිකට්ටුව ගම පිහිටි තිඹිරිගහවත්ත නමැති ඉඩමට, එස්. ශ්‍රීධරන් බලයලත් මිනින්දෝරු තැන විසින් මැන සාදන ලද අංක 4113/2009.04.30 දරන පිඹුර ප්‍රකාර බෙදූ 09 දරන බිම් තීරයට මායිම්,

*උතුරට* : එකී පිඹුරේ සඳහන් ලොට් 01, 02, 03, 04 සහ 05 දරන කොටස් ද,
*නැගෙනහිරට* : එකී පිඹුරේ සඳහන් ලොට් 05 දරන කොටස ද,
*දකුණට* : එකී පිඹුරේ සඳහන් ලොට් 05, 06, 07 සහ 08 දරන කොටස් ද, ඒ. එම්. පෙරේරා මානකතැනගේ අංක 6780 දරන පිඹුරේ සඳහන් ලොට් බී දරන කොටස ද,
*බස්නාහිරට* : පුත්තලම සිට හලාවත දක්වා දිවෙන මාර්ග සංවර්ධන අධිකාරියට අයත් පාර ද,

යන මායිම් තුළ පිහිටි රූඩ් එකයි පර්චස් හයක් (රූ. 01 පර්. 06) ක් *හෙවත්* හෙක්ටයාර් 0.116348 විශාල මීටර් හයයි දශම එකක් (6.1) වන්නා වූ අඩි විස්සක් (20) පළල ප්‍රවේශ මාර්ගය සෙසු කොටස්කරුවන් සමඟ පොදුවේ භාවිතා කිරීමේ මාර්ග අයිතිය ද සමගින් වේ. මෙය හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම 36 පත්‍ඉරුව 67 හි ලියාපදිංචි කර ඇත.

*ඉඩමට පිවිසීම*.-

ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය අසල සිට හලාවත දෙසට 86/4 බෝක්කුව දක්වා මීටර් 900ක පමණ දුරක් ගමන් කර ඉන්පසු සම්පූර්ණයෙන් ම පාහේ ආරච්චිකට්ටුව සති පොළට විරුද්ධව අඩි 20 පළල පාර වෙන්කිරීමට වමට හැරී ගමන් කළ විට විෂයගත දේපළ හමුවේ.

*ගෙවීම් ක්‍රමය*.-

වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් නියෝජ්‍ය පිස්කල් වෙත මුදලින් ගෙවිය යුතුයි. චෙක්පත් භාරගනු නොලැබේ.

(1) ගැණුම්කරු විසින් විකුණුම් මිලෙන් සියයට විසිපහක් (25%) ක් දේපළ මිලදී ගත් වහාම ගෙවිය යුතු වන අතර ඉතිරි 75% ක මුදල වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත නඩුවේ බැරට තැන්පත් කළ යුතු ය.

(2) සිවිල් නඩු විධාන සංග්‍රහයේ 258 වගන්තිය අනුව ගැණුම්කරු විසින් ගැණුම් මිලෙන් පළමු රු. 7,500/- සඳහා රු. 150/- ක ගාස්තුවක් ද, රු. 7,500/- ඉක්මවන සෑම රු. 1,000/- ක් සඳහා ම රු. 5/- බැගින් පිස්කල් ගාස්තු සහ විකුණුම් සඳහා වන සියලුම වියදම් ගෙවිය යුතු ය.

රෙජිස්ට්‍රාර්/පිස්කල්,
දිසා අධිකරණය,
හලාවත.

වර්ෂ 2024 ක් වූ සැප්තැම්බර් මස 03 වැනි දින දී ය.

09-129

---

## නොතාරිස් ලැයිස්තුව

### 107 අධිකාරය වන නොතාරිස් ආඥාපනත

ගම්පහ මහාධිකරණ කලාපය තුළ සිංහල හා ඉංග්‍රීසි භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කළ අතපත්තු පතිරන්නැහැලාගේ සෝමාවතී විජේසූරිය මහත්මියගේ 2024.02.29 දින සිට ධුරයෙන් ඉල්ලා අස්වීම රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා විසින් අනුමත කර ඇති බව මෙයින් සහතික කරමි.

ප්‍රදීප් යසරත්න,
ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය.

2024 අගෝස්තු මස 13 වැනි දින,
කොළඹ දී ය.

09-104

---

### 107 අධිකාරය වන නොතාරිස් ආඥාපනත

පානදුර මහාධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කළ ගුළුවිටගේ දයානන්ද චන්ද්‍රසිරි පීරිස් මහතා 2024.03.25 දින සිට ධුරයෙන් ඉල්ලා අස්වීම රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා විසින් අනුමත කර ඇති බව මෙයින් සහතික කරමි.

ප්‍රදීප් යසරත්න,
ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය.

2024 අගෝස්තු මස 13 වැනි දින,
කොළඹ දී ය.

09-105

**107 අධිකාරය වන නොතාරිස් ආඥාපනත**

හලාවත මහාධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කළ රාජපක්ෂ කෝරාලලාගේ රීටා ලෝරන්ස් නැතලි විනිප්‍රඩ් කල්දේරා මහත්මියගේ 2019.04.12 දින සිට ධුරයෙන් ඉල්ලා අස්වීම රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා විසින් අනුමත කර ඇති බව මෙයින් සහතික කරමි.

ප්‍රදීප් යසරත්න,
ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය.

2024 අගෝස්තු මස 13 වැනි දින,
කොළඹ දී ය.

09-106

---

**107 අධිකාරය වන නොතාරිස් ආඥාපනත**

මීගමුව මහාධිකරණ කලාපය තුළ සිංහල හා ඉංග්‍රීසි භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කළ නෙල්සන් ප්‍රසන්න කුමාරනායක මහතාගේ 2024.03.20 දින සිට ධුරයෙන් ඉල්ලා අස්වීම රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා විසින් අනුමත කර ඇති බව මෙයින් සහතික කරමි.

ප්‍රදීප් යසරත්න,
ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය.

2024 අගෝස්තු මස 13 වැනි දින,
කොළඹ දී ය.

09-107

---

**107 අධිකාරය වන නොතාරිස් ආඥාපනත**

කෑගල්ල මහාධිකරණ කලාපය තුළ සිංහල හා ඉංග්‍රීසි භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කළ කරුණාතිලක මැදගෙදර සෝමරත්න මහතා 2024.03.01 දින සිට ධුරයෙන් ඉල්ලා අස්වීම රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා විසින් අනුමත කර ඇති බව මෙයින් සහතික කරමි.

ප්‍රදීප් යසරත්න,
ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය.

2024 අගෝස්තු මස 13 වැනි දින,
කොළඹ දී ය.

09-108

# විවිධ දැන්වීම්

පෝරමය 03 (රෙගුලාසි 07)

**පෙත්සම පිළිබඳ දැන්වීම**

**මූලික සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹ දී පැවැත්වෙන බස්නාහිර පළාතේ මහාධිකරණයේ දී ය**

නඩු අංකය : CHC 56/2024/CO
ස්වභාවය : සමාගම්
කාර්ය පටිපාටිය : ලඝු

ජා ඇල, මීගමුව පාර, ලාලනි කුළුන, අංක 65 දරන ස්ථානයේ ස්වකීය ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යනු ලබන ටයිල් කලෙක්ෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම ගණන් බේරා වසා දැමීම සම්බන්ධයෙන් වන අයදුම්පත පිළිබඳ කාරණාවේ දී ය.

යෝගේන්ද්‍ර මාලූ
හවුල්කරු

(''රාජ් සහ සමාගම'' යන නාමය සහ විලාසය යටතේ ඉන්දියාව, 360001 ගුජරාට්, රාජ්කොට්, ජවාහර් පාර, පළමු මහළ, ගැලක්සි කමර්ෂල් සෙන්ටර්, 15-16 හි දැනට හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන)

(ස්වකීය ඇටෝර්නි බලකරු වන ගල්කිස්ස, පීරිස් පාර, අංක 55/39 හි මොහමඩ් මෂූඩ් මොහමඩ් රිකාස් මගින් පෙනී සිටී.)

.....................*පෙත්සම්කරු.*

*- එදිරිව -*

ටයිල් කලේක්ෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අංක 65, ලාලනි කුලුන,
මීගමුව පාර,
ජා ඇල.

.....................*ඈවර කරනු ලබන සමාගම.*

අංක 65, ලාලනි කුලුන, මීගමුව පාර, ජා ඇල යන ලිපිනයෙ හි ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති ටයිල් කලේක්ෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම කොළඹ දී සිය අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන බස්නාහිර පළාතේ මහාධිකරණය වෙත වර්ෂ 2020 ක් වූ ජූලි මස 31 වැනි දින ඉහත නම් සඳහන් සමාගම ඈවර කිරීම සඳහා පෙත්සමක් ඉදිරිපත් කර ඇති බව දැන්වීමක් මගින් දැනුම් දී ඇත. එකී පෙත්සම විභාගයට ගනු ලබන 2024 ක් වූ නොවැම්බර් මස 28 වැනි දින ඕනෑම ණය හිමියකු හෝ දායකයකු පුද්ගලිකව හෝ සිය නීතිඥවරයා මාර්ගයෙන් අධිකරණය ඉදිරියේ පෙනී සිට එකී පෙත්සම මත නියෝගයක් සටහන් කිරීමට සහය දැක්වීම හෝ ඊට එරෙහිව ක්‍රියා කළ හැක. තවදුරටත් නිසි පරිදි මුදල් ගෙවා අත්සන් කිරීමෙන් පසුව මෙකී පෙත්සමේ පිටපතක් ඕනෑම ණය හිමියෙකුට හෝ දායකයෙකුට ලබා ගත හැක.

නීතික පාර්ට්නර්ස් නීතිඥ සමාගම,
(ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥවරු),
අංක 21,
බෙල්මන්ට් වීදිය,
කොළඹ 12.

***සටහන.-*** මෙකී පෙත්සම මත මෙම නඩුවේ විමසීම අවස්ථාවේ දී අධිකරණය ඉදිරියේ පෙනී සිටීමට බලාපොරොත්තු වන ඕනෑම පුද්ගලයෙකු ඉහත නම් සඳහන් නීතික පාර්ට්නර්ස් නීතිඥ සමාගම (ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරුන්) වෙත තැපැල් මාර්ග යෙන් හෝ රැගෙන විත් බාර දීම මගින් එකී අභිප්‍රාය පිළිබඳව දැනුම් දිය යුතු ය. එකී දැන්වීමෙහි එකී පුද්ගලයාගේ නම සහ ලිපිනය

නීතිඥ ආයතනයක් මගින් ඉදිරිපත් වන්නේ නම් එකී නීතිඥ ආයතනයේ නම සහ ලිපිනය ඇතුළත් කරමින් සහ එකී පුද්ගලයා, නීතිඥ සමාගම හෝ ලේඛනගත නීතිඥවරයාගේ අත්සනින් යුතුව ඉදිරිපත් කළ යුතු වන්නේ ය. තව ද, තැපැල් මාර්ගයෙන් ඉදිරිපත් කරන්නේ නම් ඉහත ලිපිනය වෙත ළඟා වීමට කල් වේලා සහිතව සහ 2024ක් වූ නොවැම්බර් 27 වැනි දින පස්වරු 6.00 ට පෙර ඉහත ලිපිනය වෙත ලැබීමට සලස්වන්න.

09-67

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.